**දකුණු ආසියා උප කලාපීය ආර්ථික සහයෝගිතාවයෙන් ඉහළින් දිවෙන වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතිය යටතේ වැඩපල ගොඩනැගිලි සංකීර්ණ ඉදිකිරීම් ව්‍යාපෘතිය - 2021**

දකුණු ආසියා උප කලාපීය ආර්ථික සහයෝගිතාවයෙන් ඉහළින්දිවෙන වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතිය යටතේ වැඩපල ගොඩනැගිලි සංකීර්ණ ඉදිකිරීම් ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2019 ජනවාරි 17 දින එළඹි අංක 3716-එස්ආර්අයි(එස්එෆ්) දරන ණය ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09(අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ව්‍යාපෘතියේ ව්‍යාපෘති ගිවිසුම සහ ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව,වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා වරාය අධිකාරිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ඉහළින් දිවෙන වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතියේ (PAEH) ඉදිකිරීම් කටයුතු සඳහා පහසුකම් සැලසීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දැනට පවතින වැඩපල ගොඩනැගිල්ල වෙනත් ස්ථානයකට ගෙන යාමට අවශ්‍ය වීම සහ ණය ගිවිසුමේ ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, ජාතික වරාය ප්‍රධාන සැලැස්මට අනුව වරාය පහසුකම් සංවර්ධනය සඳහා සූදානම් වීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට සහාය වීමව්‍යාපෘතියේ අරමුණ වේ.ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව, ව්යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,090.08 කට සමාන වූ එ.ජ.ඩො. මිලියන 6.11 ක් වන අතර මුළු මුදලම සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ කටයුතු 2021 සැප්තැම්බර් 09 දින ආරම්භ කල යුතුව තිබුණු අතර, 2022 ජූනි 05 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කරන දිනය 2022 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මතය**

2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගනන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| 2007 අගෝස්තු 07 දිනැති අංක.MOFP/ERD/2007/2 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛය | චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන මාර්තු 31 දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුත්තේ කවුරුන්ද යන්න පිළිබඳව නිවැරදි අවබෝධයක් නොතිබුණු අතර ආසියානු සංවර්ධන බැංකුවේ නිලධාරීන්ගේ පැහැදිලි කිරීම් අනුව වාර්තාව සකස් කර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට අපි කඩිනමින් කටයුතු කළෙමු. | චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව ව්‍යාපෘතියේ මූල්‍ය ප්ර්කාශන ඉදිරිපත් කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| සංරචකය | 2021 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| | අපේක්ෂිත භෞතික කාර්යසාධනය | ළඟා කරගෙන ඇති කාර්යසාධනය | | | |
| වැඩපල ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම | 28 | 12 | 2021 දෙසැම්බර් 31 අවසන් වන විට ව්‍යාපෘතියේ වැඩවලින් ආසන්න වශයෙන් සියයට 28ක් අවසන් කිරීමට සැලසුම් කර තිබුණද, මාසික ප්‍රගති වාර්තාවට අනුව 2021 දෙසැම්බර් 31 දිනට ආසන්න වශයෙන් සියයට 12ක් පමණක් සම්පූර්ණ කිරීමට හැකි වී තිබුණි. | ප්‍රගතිය අඩුවීම සඳහා හේතු පහත පරිදි වේ.<br>i. වැඩබිම භාර දීමට ප්‍රමාද වීම - ව්‍යාපෘතිය ආරම්භ වී මාස හතරකට (04)පමණ පසු එනම් 2022.01.04 දින මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මෙම නිරවුල් නොවූ ඉඩම් කොටස මුදා හැරීම.<br>ii. ඉහළින් දිවෙන වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතියේ (PAEH) කොන්ත්‍රාත්කරු විසින් ඉහළින් දිවෙන වරාය ප්‍රවේශ මාර්ගයේ සැකැස්ම අනවසරයෙන් වෙනස් කරන ලදි. | නියමිත කාල සීමාව තුළ භෞතික ප්‍රගතිය සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගතයුතු අතර ප්‍රමාදයන් සඳහා කිසියම් සාධාරණ හේතු පවතියි නම්, ඒවා අදාළ බලයලත් නිළධාරීන්ගේ අනුමැතිය සහිතව ලේඛනගත කළ යුතුය. |

### 3.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධ ගැටළු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| වැඩපල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය 2017 ජුනි 04 දින ලැබී තිබුණි.කෙසේ වෙතත්, වසර 03කට වඩා වැඩි ප්‍රමාදයකින් යුතුව 2020 ජුනි 24 දින අදාළ ඉදිකිරීම් සඳහා ජාත්‍යන්තර ලංසු කැඳවා තිබුණි.තවද, වසරක ලංසු ක්‍රියාවලියෙන් පසු 2021 ජූලි 27 වන දින කොන්ත්‍රාත්කරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.මේ අනුව, මෙම ක්‍රියාවලිය සඳහා වසර 04කට වැඩි කාලයක් ගතවීම හේතුවෙන් ණය පොලී සහ බැඳීම් ගාස්තු (commitment charges) මෙන්ම යෙදවුම් මිල ඉහළ යාම ව්‍යාපෘතියට ආර්ථික නොවන ලෙස දැරීමට සිදු වී තිබුණි. | වැඩපල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව (CAPC) විසින් 2017 ජුනි 04 දින ශ්‍රී ලංකා වරාය අධිකාරියට අනුමැතිය ලබා දී තිබුණු අතර ශ්‍රී ලංකා රජය (GOSL) 2019 ජනවාරි 17 වැනි දින ආසියානු සංවර්ධන බැංකුව සමඟ ණය ගිවිසුම අත්සන් කර ඇත. ඒ අනුව, ව්‍යාපෘති කටයුතු සැලසුම් කර ඇත. තෝරාගත් කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා කිරීම ඇතුළුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය කිරීම සඳහා, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට සැලකිය යුතු කාල සීමාවක් ගත වී ඇත. | අනවශ්‍ය ප්‍රමාදයන් වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 පද්ධති හා පාලනයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| වගකීම් නියම කරමින් භෞතික හා මූල්‍ය ක්‍රියාකාරකම්, ඉලක්කගත කාල සීමාවන් හා ක්‍රියාකාරකම් සඳහන් කරමින් සමාලෝචිත වර්ෂය සඳහා සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සකස් කර නොතිබුණි. | සාමාන්‍යයෙන්, සියලුම ව්‍යාපෘති ඇතුළත් පොදු ක්‍රියාකාරී සැලැස්මක් අදාළ ව්‍යාපෘති අංශය විසින් සකස් කර අදාළ අනෙකුත් රාජ්‍ය ආයතන වෙත යැවීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාරීත්වය වෙත ඉදිරිපත් කරනු ලබයි. | සමාලෝචිත වර්ෂය සඳහා ඉලක්ක සහ ලගාවීම් ඇගයීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. |